


# අවසාන ආගම වන අල් කුර්ආනයේ සුවිශේෂතා

මෙලොවෙහි අල්ලාහ්ගේ නියෝජිතයා (කළීෆා) මිනිසා ය. අල්ලාහ් මිනිසාට ඔබින මග පෙන්වීම ආගම්, ‘සුහුෆ්’ යනාදී වශයෙන් කලින් කලට පිරිනමා ඇත්තේ ය. මෙම මගපෙන්වීම් අල්ලාහ් විසින් තෝරා ගන්නා ලද නබිවරුන් හා රසූල්වරුන් මගින් අනෙකුත් ජනයා වෙත ඉදිරිපත් කරන ලදී. මෙසේ අල්ලාහ් ලබා දුන් අවසාන ආගම අල් කුර්ආනය වේ.

අල් කුර්ආනය යනු අල්ලාහ් විසින් අවසාන දූතයාණන් වන ජිබ්රීල් අලෛහිස්සලාම් තුමා මගින් වහී ලෙස පාරායනය කර පෙන්වූ වැකි වේ. අල් කුර්ආනය අවසාන ආගම ලෙස පිළිගෙන එහි දේශනාවන් තම ජීවිතයේ දී ප්‍රායෝගිකව පිළිපැදීමත් එය අන් අයට දන්වා සිටීමත් මුස්ලිම්වරුන් සියල්ලන්ගේ ම යුතුකම වන්නේ ය.

## අල් කුර්ආනය අවසාන ආගම වීමට හේතු සාධක

### 01 “අල් කුර්ආනයේ දයාදයන් අවසන් විය” යන පණිවිඩය,

**“අද දින මම නුඹලා වෙනුවෙන් නුඹලාට නුඹලාගේ ආගම සම්පූර්ණ කළෙමි. තව ද නුඹලාගේ දීන් (ජීවන රටාව) වශයෙන් ඉස්ලාමය සතුටින් තෝරා දුනිමි.”** (5:3) මෙම වැකිය අල්ලාහ්ගේ මග පෙන්වීම සම්පූර්ණ වූ බවත් මග පෙන්වීම් පහල නොවන බවත් තහවුරු කරයි.

## 02. අල් කුර්ආනය අවසාන නබිවරයා වෙත පහළ කරනු ලැබීම.

"අවසාන දූතයා (නබි) වනුයේ මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා බව අල් කුර්ආනය සහ සුන්නාව මගින් තහවුරු කරනු ලැබූ සත්‍යයකි. ඔහුගෙන් පසු වෙනත් නබිවරයකු පහළ වීමට අවකාශයක් නැත.

## 03. අල් කුර්ආනයට පසු වෙනත් ආගමක් පැමිණි බවට කිසි දු සාධකයක් නැත.

නබිවරුන්ගේ පැමිණීමත් ඔවුන්ට ආගම් ලබා දීමත් ඉතිහාසයේ ආශ්චර්යවත් දෙයක් ලෙස දක්නා ලදි. මේවා ලිඛිතව හෝ මුඛ පරම්පරා ගතව ලෙසින් හෝ ආරක්‍ෂා වෙමින් පැමිණ තිබේ. අල් කුර්ආනයෙන් පසු වෙනත් ආගමක් පහළ වූ බවට කිසි දු තොරතුරක් දැන ගැනීමට නොලැබිණි. "අල් කුර්ආනය අවසාන ආගම වේ" යන්න සහතික කරයි.

## 04. අල් කුර්ආනයට පමණක් අනන්‍ය වූ සුවිශේෂතා

කලින් වූ ආගම් කිසිවක් නොලද සුවිශේෂී ලක්‍ෂණවලින් අල් කුර්ආනය සමන්විත වේ. ඒ සෑම සුවිශේෂී ලක්ෂණයක් ම අල් කුර්ආනය අවසාන ආගම වේ" යන්නට සාධක වේ.

### මුළුමනින් ම ආරක්‍ෂා වූ ආගමයි

කලින් වූ ආගම් කාලය ගතවීමක් සමග ම කල්යත් ම එහි කොටසක් හෝ මුළුමණින් ම හෝ තුරන් වී තිබේ. නැතහොත් වෙනස් වී තිබේ. ඒවා සුරක්ෂිත කරන බවට අල්ලාහ් පොරොන්දු වූයේ ද නැත. එහෙත් අවසාන ආගම වන අල් කුර්ආනය ආරක්‍ෂා කරන බවට අල්ලාහ් පොරොන්දු වී තිබේ. **"නිශ්චිත වශයෙන් ම (සිහිගන්වන) මෙම ධර්මය (ඔබ වෙත) පහල කළේ අපි වෙමු. නිශ්චිත වශයෙන් ම එහි ආරක්ෂකයායා ද අපිම වෙමු."** (15:9)





## එය සියල්ලන්ට ම පොදු වූ දහමකි

පෙර පැවති ආගම් පහළ වූයේ නිශ්චිත වූ ප්‍රදේශ හෝ ජන කොට්ඨාස වෙත ය. එහෙත් අල් කුර්ආනය සියලු ප්‍රදේශවලට හා සියලු ජාතීන්ට පොදු වූවක් ලෙස පහළ කරනු ලැබ තිබේ.

**"නියත වශයෙන් එය ලෝකවාසීන්ට අනුශාසනා කරන උපදේශයක් මිස අන් කිසිවක් නොවේ."** (81 : 27)

## පරිපූර්ණ මග පෙන්වීමකි

මිනිස් ජීවිතයේ සියලු අංශවලට ඔබින පරිපූර්ණ මගපෙන්වීම අල් කුර්ආනයෙහි ගැබ්ව තිබේ.

**"...එනිසා සෑම දෙයකට ම පැහැදිළි කිරීමක් වශයෙන් ද (අල්ලාහ් ට) අවනත වන අයට යහමග වශයෙන් ද දයාලුව හා ශුභාරංචිය වශයෙන් ද අපි නුඹට (මෙම) ධර්ම ග්‍රන්ථය පහළ කළෙමු."** (16:89)

## අල් කුර්ආන් මුඃජිසාතයකි

නබිවරුන්ට හා රසූල්වරුන්ට අල්ලාහ් විවිධාකාර අන්දමේ 'මුඃජිසාත්' ලබාදුන් අතර ඔවුහු තම 'දෑවාව' ඉදිරිපත් කිරීම සඳහා මේවා උපයෝගී කර ගත්හ. අල්ලාහ් මුහම්මද් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාට 'මුඃජිසාතය' ලෙස ලබා දුන්නේ අල් කුර්ආනය යි. අල් කුර්ආනයට සමාන යමක් ගෙන එන ලෙස අල්ලාහ් අභියෝග කළේ ය.

**"අපගේ ගැත්තා (මුහම්මද් නම් ධර්මදූතයාණන්) ට අප පහළ කළ දෑ (අල් කුර්ආනය) සම්බන්ධයෙන් (එය අල්ලාහ් විසින් පහළ කළ බවට) නුඹලා සැකයේ සිටී නම් එවැනි සූරතයක් ඉදිරිපත් කරනු. තව ද (එය සාක්ෂාත් කරනු වස්) අල්ලාහ් හැර නුඹලාගේ ආධාර කරුවන් කැඳවාගනු, නුඹලා සත්‍යවාදීහු නම්"** (2: 23)

## සජීවී භාෂාවක් ලෙස පැවතීම.

පෙර පැවති ආගම් පහළ කරන ලද භාෂාවන් අද භාවිතයේ නැත. එහෙත් අල් කුර්ආනය පහළ වූ අරාබි භාෂාව අද ද ව්‍යවහාර භාවිතයේ දක්නට තිබේ. අල් කුර්ආනයේ අදහස් විචාර බුද්ධියට ගෝචර වේ. අල් කුර්ආනය සඳහන් කරන බොහෝ කරුණු වර්තමානයේ විද්‍යාත්මක ව තහවුරු වෙමින් තිබේ.

## අල් කුර්ආනයේ අන්තර්ගතය

අල් කුර්ආනය මිනිසාට අවශ්‍ය සියලු මූලික මගපෙන්වීම් අන්තර්ගත දේව ග්‍රන්ථයකි. අල් කුර්ආනය අන්තර්ගතය, අනුව මාතෘකා පහක් යටතේ බෙදා වර්ග කර දැක්විය හැකි ය.

01. සැඟවුණු කරුණු. (විශ්වාස කළ යුතු දෑ)
02. නැමදුම් හා වැඳුම් පිදුම්.
03. ජීවිතයට අදාළ නීති රීති.
04. ආචාර ධර්ම.
05. අපට ආදර්ශ ලබා දෙන ඉතිහාසයන්.

## අල් කුර්ආනයේ ව්‍යුහය

අල් කුර්ආනය පරිච්ඡේද 114කින් සමන්විත ය. ඒවා 'සූරා' නම් වේ. එසේ ම අල් කුර්ආනය වාක්‍ය 6666කින් පමණ සමන්විත ය. ඒවා 'ආයත්' නම් වේ. තව ද එය ජුස්ඌ 30ක් සහ මන්සිල් 7ක් ලෙස බෙදේ.

**ඒ අනුව අවසාන ආගම අපට ලැබී තිබීම, අල්ලාහ් අප කෙරෙහි දැක්වූ දයාදයකි. එය වටහාගෙන අල් කුර්ආනය කෙරෙහි අපගේ වගකීම් අල්ලාහ් බලාපොරොත්තු වන පරිදි ඉටු කරමු.**

### පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන

خَلِيْفَةٌ  صُحُفٌ  مُعْجِزَةٌ  دَعْوَةٌ  جُزْءٌ  مَنْزِلٌ  آيَةٌ  سُوْرَةٌ

### අභ්‍යාස

1. "අල් කුර්ආනය අවසාන ආගම වේ" යන්නට හේතු තුනක් ඉදිරිපත් කරන්න.

2. අල් කුර්ආනය සතු සුවිශේෂ ලක්ෂණ හතරක් දක්වන්න.

3. අල් කුර්ආනයේ අන්තර්ගතය මාතෘකා කීයකට බෙදිය හැකි ද?
   ඒවා මොනවා ද?